දිමුතු ප්‍රකාශකයෝ
DIMUTHU PUBLISHERS

No. 2/1c, Makola South
Makola.
Tel : 011 - 2905431
011 - 2987779
077 - 1154849
Fax : 011 - 2987778
011 - 4812539
WhatsApp: 074 - 2477868
077 - 3536323
E-mail:dimuthuprinters@gmail.com

දැන් අප ආයතනයේ සියලු තොරතුරු අන්තර්ජාලය ඔස්සේ ලබාගත හැක.
පිවිසෙන්න:
www.dimuthuprinters.com

# 2024 පළමු වාර පරීක්ෂණය සඳහා ප්‍රශ්න පත්‍ර සැපයීම

විදුහල්පතිතුමා/ විදුහල්පතිතුමිය

අප ආයතනය වසර 31 ක පමණ කාලයක සිට දිවයිනේ විද්‍යාල බොහොමයක් සඳහා විභාග ප්‍රශ්න පත්‍ර, පංති වාර්තා පොත් සහ තක්සේරු වාර්තා, නිපුණතා පොත් ඇතුළු අනිකුත් ලිපි ද්‍රව්‍ය සැපයීමෙන් ලබා ගත් විශ්වාසය හා දැනුම මත මේ වසරේ ද 2024 ට නියමිත පළමු වාර පරීක්ෂණයේ 01 සිට 11 දක්වා ශ්‍රේණි සඳහා අවශ්‍ය ප්‍රශ්න පත්‍ර අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විටින් විට නිකුත් කරනු ලබන චක්‍රලේඛනයන් අධ්‍යයනය කරමින් <u>ප්‍රවීණ ගුරු උපදේශක මණ්ඩලයකගේ සකස් කිරීම හා අධීක්ෂණය යටතේ</u> විෂය නිර්දේශයන්ට අනුකූලවම සකසා මුද්‍රණය කර බෙදා හැරීමට සියලු කටයුතු දැන් සූදානම් කර ඇති බව ඉතා සතුටින් දන්වා සිටින අතර ඔබගේ පහසුව සඳහා ඒ පිළිබඳ සියලු තොරතුරු මෙහි පහත දක්වා ඇත.

(1) **විභාගය ආරම්භ කරන දිනය : 2024 මැයි 30**

(2) **අයදුම් පත් භාර ගන්නා අවසන් දිනය : 2024 මැයි 20**

(3) ලිපි ලේඛන ප්‍රවාහන හා අනෙකුත් කටයුතු සඳහා ලබාදෙන වට්ටම 01 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා **: 15% යි.**

(1) 1 වන ශ්‍රේණියේ සිට 5 වන ශ්‍රේණිය දක්වා අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති විෂය නිර්දේශයට අනුකූලව සියලු ම ප්‍රශ්න පත්‍ර සකස් කරනු ලැබේ. **( 1, 5 ශ්‍රේණි ප්‍රශ්න පත්‍ර gsm 60 සුදු මුද්‍රණ කඩදාසියේ මුද්‍රණය කරනු ලැබේ.)**

(2) 6 සිට 11 වෙනි ශ්‍රේණිය දක්වා සියලු ම ප්‍රශ්න පත්‍ර කොටස් දෙකකින් ද 10, 11 පංතිවල සිංහල හා චිත්‍ර කලාව කොටස් තුනකින් ද සකස් කර ඇත. ගණිතය, විද්‍යාව, ඉතිහාසය ඇතුළු සියලු ම විෂයන් නව විෂය නිර්දේශයට අනුව සකස් කර ඇත.

(3) **කාණ්ඩ විෂයයන්**

10 - 11 ශ්‍රේණි සඳහා කාණ්ඩ විෂයයන් චිත්‍ර කලාව, නැටුම්, සංගීතය, ගෘහ විද්‍යාව, ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය, ව්‍යවසායකත්ව අධ්‍යයනය, කෘෂි හා ආහාර තාක්ෂණය, සිංහල සාහිත්‍යය, ඉංග්‍රීසි සාහිත්‍යය, සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය, භූගෝල විද්‍යාව, පුරවැසි අධ්‍යාපනය, නාට්‍ය හා රංග කලාව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය, දෙමළ යන විෂයනට පමණක් සීමාවන අතර, ඒ සඳහා ශිෂ්‍ය සංඛ්‍යා ලේඛණයේ වෙනම දක්වා ඇති වගුව සම්පූර්ණ කිරීමට කටයුතු කරන්න. (මේ සඳහා වෙනමම මුදලක් අය කරනු නොලැබේ.)

**ENGLISH MEDIUM**

පසුගිය වාරයේ මෙන් මේ වාරයේ ද ඉංග්‍රීසි මාධ්‍ය ප්‍රශ්න පත්‍ර අප ආයතනය මගින් අමතර මුදලක් අයනොකර ලබාදීමට කටයුතු කරනු ලැබේ. එහිදී සිංහල හා ඉංග්‍රීසි මාධ්‍ය දෙකෙහි එකතුව මුළු ශිෂ්‍ය සංඛ්‍යාවට සමාන විය යුතු අතර ඉංග්‍රීසි මාධ්‍ය සඳහා ගණිතය, විද්‍යාව, සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය, භූගෝල විද්‍යාව, පුරවැසි අධ්‍යාපනය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යන විෂයන් ලබාගත හැක.

(4) **පිළිතුරු පත්‍ර**

සිසුනට ඉතා ඉක්මනින් ලකුණු ලබා දීමට අවශ්‍ය බැවින් ඒ පිළිබඳ අපගේ දැඩි අවධානය යොමු කර පෙර වසරවලදී මෙන් ම පිළිතුරු පත්‍ර ප්‍රශ්න පත්‍ර සමගම ලබා දීමට කටයුතු සූදානම් කර ඇත. (ආරක්ෂිත කවරයක බහා විදුහල්පතිතුමාගේ නමට එවනු ලැබේ.)

(5) **අතිරේක ප්‍රශ්න පත්‍ර**

පාසලේ ප්‍රශ්න පත්‍ර ගොණුවට හා විෂය භාර ගුරුභවතාගේ ප්‍රයෝජනය සඳහා පහත සඳහන් පරිදි අතිරේක ප්‍රශ්න පත්‍ර සපයනු ලැබේ. එය ශිෂ්‍ය සංඛ්‍යාව 01 -25 දක්වා ප්‍රශ්න පත්‍ර 2 ක් ද, ශිෂ්‍ය සංඛ්‍යාව 25 - 50 දක්වා ප්‍රශ්න පත්‍ර 3 ක් ද, ශිෂ්‍ය සංඛ්‍යාව 50 -75 දක්වා ප්‍රශ්න පත්‍ර 4 ක් ද, ශිෂ්‍ය සංඛ්‍යාව 75 -100 දක්වා ප්‍රශ්න පත්‍ර 5 ක් ද, වශයෙන් සපයනු ලැබේ.

(6) **ලිපි ද්‍රව්‍ය සැපයීම**

10, 11 සඳහා අවශ්‍ය බහුවරණ පිළිතුරු ලියන කඩදාසි ද ප්‍රශ්න පත්‍ර පැකට් කරන අවස්ථාවේ එම පැකට් තුළට ම ඇතුළු කරනු ලැබේ.

**<u>එක් එක් කට්ටලයට මුදල් ගෙවිය යුතු පිලිවෙළ</u>**

| | | | |
|---|---|---|---|
| 1, 2 ශ්‍රේණි සඳහා | රු. 100.00 | 6, 7, 8, 9 ශ්‍රේණි සඳහා | රු. 200.00 |
| 3, 4, 5 ශ්‍රේණි සඳහා | රු. 150.00 | 10, 11 ශ්‍රේණි සඳහා | රු. 300.00 |

(6) **ප්‍රශ්න පත්‍ර විද්‍යාලවලට බෙදා හැරීම**

තැපැල් ගාස්තුව සඳහා අධික මුදලක් වැයවන බැවින් පසුගිය වාර පරීක්ෂණයේදී මෙන් ප්‍රශ්නපත්‍ර අප ආයතනයට පැමිණ රැගෙන යාම ඉතාම සුදුසු ක්‍රමයයි. එයින් ඔබ හා අප අතර ඇති බැඳීම හා විශ්වාසය තව තවත් තහවුරු වනු ඇත. තවද තැපැල් ගාස්තුව වශයෙන් තැපැල් කාර්යාලයට ගෙවීමට සිදුවන විශාල මුදලක් ඔබට ඉතිරි කරගත හැක. නමුත් ඔබ අප වෙතින් ඉල්ලීමක් කළහොත් (තැපැල් ගාස්තුව ගෙවා පාර්සල් භාර ගැනීමට හැකි බව) එවිට පාර්සල් තැපැල් කිරීම සිදුකළ හැක. **එසේ තැපැල් මගින් ගෙන්වා ගනු ලබන විද්‍යාල ප්‍රශ්නපත්‍ර සඳහා ළමුන්ගෙන් මුදල් එකතු කරන විට තැපැල් ගාස්තුව සඳහා ද යම් මුදලක් එකතු කර ගැනීමට කටයුතු කරන්න.** තවද දුම්රියෙන් පාර්සල් ගෙන්වා ගන්නා විද්‍යාල සඳහා දුම්රිය ගාස්තු අප ආයතනය විසින් දරනු ලැබේ. (සෑමවිටම ඔබගේ ප්‍රශ්න පත්‍ර පාර්සල් ළඟම ඇති දුම්රිය ස්ථානය වෙත ගෙන්වා ගැනීමට කටයුතු කරන්න. තවද ඔබවෙත එවා ඇති සංඛ්‍යා ලේඛන කොළයෙහි ඇති දුම්රිය මගින් ගෙන්වා ගැනීම යන කොටස සම්පූර්ණ කරන්න.)

(7) **විදුහල්පතිතුමාගේ/තුමියගේ තොරතුරු**

**ඔබ වෙත එවා ඇති සංඛ්‍යා ලේඛණ කොටු කොළයේ විදුහල්පතිතුමාගේ හෝ ප්‍රශ්නපත්‍ර සම්බන්ධීකාරකගේ පෞද්ගලික ලිපිනය, ජංගම දුරකථන අංකය, වට්ස්ඇප් අංකය සහ ඊමේල් ලිපිනය සටහන් කිරීමට කටයුතු කරන්න. ඇණවුම අපවෙත ලැබුණු පසු හා ඔබගේ ප්‍රශ්න පත්‍ර ඔබ සඳහන් කර ඇති ආකාරයට අප ආයතනයෙන් නිකුත් කළ පසු සියලු තොරතුරු ඔබ අපවෙත ලබාදී ඇති ජංගම දුරකථනයට SMS මගින් හෝ E-mail මගින් දැනුම්දීමක් කරනු ඇත. තවද විද්‍යාල වේලාවෙන් පසු යම් ගැටළු සහගත තත්වයක් ඇති වුව හොත් එය විසඳා ගැනීම සඳහා ඉහත දුරකථන අංකය අපහට බෙහෙවින් ප්‍රයෝජනවත් වනු ඇත. (කාලසටහන ඔබ ලබාදෙන ඊමේල් ලිපිනයට සහ වට්ස්ඇප් අංකයට එවීමට කටයුතු කරනු ලැබේ.)**

(1) **ප්‍රථම ගෙවීම**

ශිෂ්‍ය සංඛ්‍යා ලේඛණ සමග **මුළු මුදලින් 50%ක් ගෙවිය යුතුයි.** විද්‍යාලයේ ළමුන්ගේ සියලු ම විභාග මුදල් එකතු වූ පසු ඉතිරි මුදල් ගෙවා ප්‍රශ්නපත්‍ර ලබාගැනීමට කටයුතු කරන්න. (අත්තිකාරම් මුදල් නොමැති අයදුම්පත් ලේඛනගත කරනු නොලැබේ.)

(2 ) **මුදල් ඇණවුම්**

මාකොළ ප්‍රධාන තැපැල් කාර්යාලයෙන් පමණක් මාරුකරගත හැකි වන සේ එවීමට කටයුතු කරන්න. අප ප්‍රශ්නපත්‍ර පැකට් කරනු ලබන්නේ ආයතනයට ලැබෙන අනුපිළිවෙලට අනුව ය. එම නිසා ඔබගේ ශිෂ්‍ය සංඛ්‍යාලේඛණ අවසන් මොහොත වන තෙක් නොසිට කඩිනමින් අපවෙත ලබාදීමට කටයුතු කරන්න.

**චෙක්පත්**

කළමනාකරු දිමුතු ප්‍රකාශකයෝ නමින් රේඛණය කරන ලද චෙක්පත් පමණක් එවන්න. විද්‍යාලයීය ගිණුමකින් නිකුත් කරන ලද චෙක්පත් පමණක් භාරගන්නා බව කරුණාවෙන් සලකන්න.

**වැදගත් : අවසාන ගෙවීම පෞද්ගලික චෙක්පත් මගින් භාරගනු නොලැබේ.**

**බැංකුගත කිරීම**

| | | | |
|---|---|---|---|
| බැංකුව | : **ලංකා බැංකුව - මාකොළ** | බැංකුව | : **සම්පත් බැංකුව** |
| ගිණුම් අංකය | : 0074168080 | ගිණුම් අංකය | : 000510015959 |
| ගිණුමේ නම | : දිමුතු ප්‍රකාශකයෝ | ගිණුමේ නම | : දිමුතු ප්‍රකාශකයෝ |

**බැංකුව මගින් ඔබවෙත ලබාදෙන ලදුපතෙහි පාසලේ නම ලියා අනිවාර්යයෙන්ම සංඛ්‍යා ලේඛන සමග අමුණා එවීමට කටයුතු කරන්න. නැතහොත් අපගේ WhatsApp අංකයට යොමුකිරීමට කටයුතු කරන්න. (074 2477868)**

(3) **ඉතා කඩිනමින් ප්‍රශ්නපත්‍ර ඔබට ලබාදීම සඳහා කලට වේලාවට ශිෂ්‍ය සංඛ්‍යා ලේඛන එවීමෙන් හා මුදල් සියල්ල ගෙවා අවසන් කිරීමෙන් අපට සහය වන්න.**

**කඩිනමින් ඔබේ කාර්යය ඉටුකර දීම අපේ අරමුණයි.**

**ස්තූතියි.**
**මෙයට විශ්වාසී වූ,**

**කළමනාකරු,**
**දිමුතු ප්‍රකාශකයෝ.**

**ආයතනයට පැමිණීමේ ගමන් මග**

**කිරිබත්ගොඩ මාකොළ පාරේ තැඹිලිගස්මුල්ල හන්දියේ අංක 2/1c ස්ථානයේ නව සිව්මහල් ගොඩනැගිල්ලේ අපගේ ආයතනය පිහිටුවා ඇති බව සතුටින් දන්වා සිටිමු.**

**අප ආයතනයෙන් ලබාගත හැකි ලිපි ද්‍රව්‍ය**

| | | | | |
|---|---|---|---|---|
| **පංති වාර්තා පොත (අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් ඉදිරිපත් කළ කරුණු ඇතුළත්)** | **පොත්** | 1 ක් | රු. | 550.00 |
| **පංති වාර්තා පොත (විශේෂ පොත)** | **පොත්** | 1 ක් | රු. | 700.00 |
| **ප්‍රගති වාර්තාව** (ඇගයීම් ලකුණු, වාර පරීක්ෂණ ලකුණු සහ ගුරුදෙගුරු සබඳතාවයට අවශ්‍ය සියලුම කරුණු ඇතුලත් වේ.) | **පොත්** | 1 ක් | රු. | 150.00 |
| **නිවාඩු ඉල්ලුම් පත්‍ර** | **පත්‍රිකා** | 50 ක් | රු. | 150.00 |
| **I II III අවධි සඳහා අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා පොත** | **පොත්** | 1 ක් | රු. | 150.00 |
| **සිසු - ගුරු ප්‍රගති සටහන් පොත** (වාර සටහන් / දින සටහන්) | **පොත්** | 1 ක් | රු. | 800.00 |